# පූස් පැටියාට යාළුවෙක්



කතෘ : අශ්විනී ආරද්‍යා වීරසේකර

# පූස් පැටියාට යාළුවෙක්

**අශ්විනී ආරද්‍යා වීරසේකර**

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති**

**පළමු දිගහැරීම**

**මහමායා බාලිකා විද්‍යාලය**

**1 ශ්‍රේණිය A**

**2026/05/10**

**978-624-211-259-6**

# පිදුම

මගේ

ආදරණීය

පන්තිභාර

ගුරුතුමිය

වෙත

පුදමි....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකෝමත් එක ගමක පූස් පවුලක් ජීවත් වුණා. පූස් අම්මයි පූස් තාත්තයි පූස් පැටියයි ඉතාම සතුටින් කාලය ගත කලා.





පූස් තාත්තා දඩයමට හරිම දක්ෂයි. එයා සත්තු දඩයම් කරලා පූස් පැටියටයි අම්මටයි කන්න ගෙනත් දෙනවා.

පූස් පැටියා දැන් ටිකක් ලොකු නිසා දඩයම්

කරන්න කියලා දෙන්න ඕන කියලා පූස් තාත්තා

සිතුවා. දවසක් උදේම පූස් තාත්තා පූස් පැටියාත්

එක්කරගෙනම කැලෑවට ගියා. පූස් තාත්තා දන්න

හැම ශිල්ප ක්‍රමයක්ම පූස් පැටියාටත් කියලා

දුන්නා. පූස් පැටියාත් සතුටින් තාත්තා කියලා

දුන්න දේවල් ආසාවෙන් ඉගෙන ගත්තා.

ඉතිං දවසක් පූස් තාත්තා පැටියත් එක්ක ගමනක් යනකොට චූටි මේ පැටියෙක් පඳුරක් අස්සේ ඉන්නවා දැක්කා. පූස් තාත්තා පැටියාට කියලා දුන්න දේවල් මතකද කියලා බලන්න, මී පැටියාව දඩයම් කරන්න කියලා කියුවා. පූස් පැටියා දුවගෙන ගියා මී පැටියා අල්ලන්න. මී පැටියා බයේ වෙවුලුවා.

“අනේ මාව අතාරින්න” මී පැටියා කියුවා. පූස් පැටියාට හොඳටම දුක හිතුනා, මී පැටියා ගැන. “ ඇයි ඔයා තනියම මෙතන?” පූස්  පැටියා ඇහුවා. අනේ මගේ අම්මයි තාත්තයි අර ඈත පේන ගෙදර ඉන්න ලොකු පූස් හාමි කෑවා. පූස් පැටියාට හරිම දුකයි ඒ කතාව අහලා. එයා මී පැටියාට යන්න දුන්නා.





පූස් පැටියා ඊළඟ දවසෙත් මී පැටියා හමුවුණ තැනට ගියා. ඒත් මේ පැටියා එතන හිටියේ නෑ. පූස් පැටියා ටික වෙලාවක් බලාගෙන ඉඳලා ආපහු ගෙදර ගියා.

තවත් දවසක් උදේ කෑමට පූස් පැටියාට අම්මා චීස් කෑල්ලක් දුන්නා. පූස් පැටියා ඒක කනකොට එයාට මී පැටියා මතක් වුණා. චීස් කෑල්ලත් අරන් පූස් පැටියා මීයා හමු වූ තැනට ගියා. අනේ එදා මී පැටියා ආයෙමත් එතන හිටියා. පූස් පැටියාට හරිම සතුටුයි. පූස් පැටියා දැකලා මී පැටියා බය වුණා. එයා ආපහු හැරිලා දුවන්න හැදුවා.

"දුවන්න එපා යාළුවේ. මං ඔයාට කෑමක් ගෙනාවා." පූස් පැටියා කියුවා. මී පැටියා පුදුමයෙන් නතර වී පූස් පැටියා දිහා බැලුවා. පූස් පැටියා චීස් කෑල්ල මී පැටියාට දුන්නා. මී පැටියා බයෙන් බයෙන් පූස් පැටියා ළඟට කිට්ටු වුණා. බඩගින්නත් ඉවසගන්න බැරි තරමට තිබුණු නිසා මී පැටියා චීස් කෑල්ල හරිම ආසාවෙන් ගත්තා. "බොහෝම ස්තූතියි පූස් හාමි" මී පැටියා කිව්වා.



පූස් පැටියා ගෙදර ගිහින් එයාගේ අම්මාට කතා කළා. "අම්මේ අපි සත්තු දඩයම් කරන්නට ඕනද?" "නෑ පුතේ අපි කැමතිනම් සත්තු දඩයම් නොකර ලැබෙන දෙයක් කාලා ඉන්න පුළුවන්." අම්මේ මට බෑ දඩයම් කරලා සත්තු කන්න. එයාලා පව් අම්මේ.

මං තාත්තත් එක්ක ගමනක් යනකොට මං වගේම පුංචි මී පැටියෙක් හිටියා. තාත්තා එයාව අල්ලන්න කිව්වා. ඒත් එයා ළඟට ගියාම එයා කියපු කතාව අහලා මට ගොඩක් දුක හිතුනා අම්මේ. ඒ මී යාළුවගේ අම්මයි තාත්තයි දෙන්නම නෑ. එයාට කෑම හොයලා දෙන්නවත් කෙනෙක් නෑ.

මං මගේ කෑම වලින් කොටසක් එයාට දුන්නා අම්මේ. පූස් පැටියාගේ කතාව අහලා පූස් අම්මාටත් මී පැටියා ගැන දුක හිතුනා. ඒ වගේම පූස් පැටියා ගැන ගොඩක් සතුටු හිතුනා.

පූස් පැටියා එයාගේ අම්මයි තාත්තගෙයි අවසරය ඇතුව මී පැටියාව පූස් ගෙදර එක්කන් ආවා. එදා ඉදන්  මී පැටියා පූස් පවුලේ සාමාජිකයෙක් වුණා. පූස් පැටියා මී පැටියා එක්ක සෙල්ලම් කලා. දැන් පූස් පැටියාට හරිම සතුටුයි. මී පැටියාත් හරිම සතුටින් විනෝදයෙන් කාලය ගත කලා. එයාට අම්මා තාත්තා නැති අඩුව කවදාවත් දැනුනේ නෑ.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

**978-624-211-259-6**